


https://youtu.be/MnW2OfgHM88

"ගව් ගණන් දුර ගෙවා ආවෙමි....

බරයි මට මේ ජීවිතේ....."

කවදා හෝ ජීවිතයේ මෙහෙම ඔබටත් හිතෙන්න ඇති. ඔව් අප උසුලාගෙන යන බර තවත් අප විසින් උසු ලාගෙන යාමට සිදුවනු ඇත. ජීවන සත්යය එයයි .එහෙත් අප සිනාසිය යුතුව ඇත. ඒ නිසාම මාත් සිනාස ෙන්නම්.

වරෙක " සමුද්‍ර දේවී" නුර්ති නාට්‍යයේ සමුද්‍ර දේවිය ලෙස රංගනයෙන් දායක වී ටවර් හෝල් පදනමේ හොඳම නිලියට හිමි සම්මානයට පාත්‍ර වූ මහනුවර උසස් බාලිකාවේ සිසුවියක වූ ඇය, තවත් වරෙක ජප ානයේ අන්තර් විශ්ව විද්‍යාලයීය කුසලතා තරග "ලෝක රූ රැජින " ලෙස ලංකාව නියෝජනය කල පේ රාදෙණිය වෛද්‍ය පීඨයේ සිසුවියක වූවාය. ....

දැන් වෛද්‍ය වරියක් සහ විශ්ව  විද්‍යාලයීය කථිකාචාර්යවරියක් වශයෙන් හිම මිදෙන විදේශයක සේවය කරන ඇය කාන්චනමාලා රණසිංහ ....

ඇගේ කුළුදුල් සරල ගීතයේ වැඩ පසුගිය දා නිම කලා.

ඇය සුවිශේෂී කලා පවුලක සාමාජිකාවක් වීමත් විශේෂයි .

ඇය මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ " සිංහබාහු " නාට්‍යයේ පළමු සුප්පාදෙවියයටත් පොතේගුරුටත් පන පෙවූ මාලිනී රණසිංහ සහ ටෙරන්ස් රණසිංහ යුවලගේ දියණියයි.
.. ඇගේ ආදරණීය මවත් පියාත් නොකඩවා වසර 30 කට වැඩි කාලයක් දර්ශන වාර 5000 කට වඩා වැ ඩි වරක් සිංහබාහු නාට්‍යයට රංගනයෙන් දායක වී ගිනස් වාර්තාවක් පිහිටුවීම සිහිපත් කරන්නේ ඒ කැපවී ම පිටිපස සිටි පවුල් සාමාජිකාවක වූ කාන්චනමාලා සොයුරිය එම කලා පවුලේ ඊලඟ සාමාජිකාවයි.ඇය ටද සරස්වතියගේ ආශිර්වාදය හිමිව ඇති වග ඔබටද වැටහෙනු ඇත.

ඔබට මේ ගීතයට සවන් දීමට ඇරයුම් කරන්නේ සෙනෙහසිනි .

මේ ගීයේ සංකල්පවාව ඇගේ ආදරණීය මෑණියන් වන පුවීණ කලාකාරිනිය මාලිනී රණසිංහයන්ගේ. ගී

පද රචිකා ප්‍රියංගි ගුණවර්ධන සොයුරිය තමා මුල් පද මට ලියා අනගි සහයක් දුන්නේ. ඒ දෙදෙනාටම ම ගේ සෙනෙහස පුද කරමි...

ඇගේ මේ නව නිර්මාණ ගීතය මා විසින් ලියූ අතර තනුව සහ සංගීතය විශාරද දර්ශන වික්‍රමතුංග සොයුරා ගෙනි ... ගීතය පටිගත කරනු ලැබුවේ සදරු ගමගේ සොයුරා විසින්....

අලුත් මල් ගලඹකින් සැරසී හෙට හිනාවෙන කලාකාරිනියට හදවතින්ම සුබ පතමු....!

ගව්ගණන් දුර ගෙවා ආවෙමි

හිම මිදුණ මිටියාවතේ

උණුසුමක් නැති මතක හතිලා

විඩා නිම නොවනා රුයේ

බරයි මට මේ ජීවිතේ

දෙනෝ දාහක් සිනාසෙන කල

සිනාටසන්නට කරුණු සෙව්වෙමි

සදා වැලපෙන සුසුම් සගවා

කීරි ගැහෙනා පපුතුරේ...

පිපී දිලෙනා නේක කුසුමන්

පරව යන බව හොඳින් දන්නෙමි

අලුත් මල් කළඹකින් සැරසී

හෙට හිනාවෙන තුරු හිසේ

නයනසේන වන්නිනායක

මේ ගීය මම කිහිපවරක්ම නැවත නැවතත් එක දිගට ඇසීමි. මම ඊට බොහෝ ඇලුම් කරමි. මතුපිටින් පළකෙරෙන ඒ විඩාබර, රිදුම්දෙන හදින් නැගෙන සියුම් වේදනාවට යටින්, සංසාරික සත්‍ය පිලිබඳ ගැඹුරු අරුතක් ගීයේ වදන් පෙලින් ධ්වනිත වන්නේදැයි මට සිතෙයි

Prof Wimal Rankaduwa
Canada